12[th] Academic Sessions
University of Ruhuna, Matara, Sri Lanka
ISSN 2362-0412

# අඩු ආදයම්ලාභී පවුල්වල රැකියාවන්හී නියුක්ත කාන්තාවන් ගෘහස්ථ භූමිකාව තුළ මුහුණදෙන ගැටලු

නිලූෂා දැල්පිටිය
*සමාජවිද්‍යා අධ්‍යනාංශය,රුහුණ විශ්වවිද්‍යාලය*

*nildalpitiya@gmail.com*

**සාරසංක්‍ෂේපය**

අතීතයේ සිටම ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ ස්ත්‍රියගේ භූමිකාව ගෘහයට සීමාවූ කාර්යභාරයක් පමණක් අපේක්ෂා විණි. නමුත් සමාජ නවීකරණය තුළ කාන්තා භූමිකාව ගෘහීය පරිසරයෙන් මිදී වෙනත් ආර්ථික ක්ෂේත්‍රයන් කරා පැතිරෙන්නට විණි. කාන්තාව ගෘහයෙන් පරිබාහිර ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ වීම හේතුකොටගෙන ඇය සම්බන්ධ සමාජ ආකල්පයන් වෙනසකට භාජනය වන අයුරු දක්නට ලැබුනද ඇයගේ ගෘහස්ථ භූමිකාව තුළ ඉටුකළයුතු ක්‍රියාකාරකම් හී අඩුවක් දක්නට නොලැබුණි. විශේෂයෙන් ම ඉහල ආදායම්ලාභී පවුල්වලට සාපෙක්ෂව අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තා භූමිකාව වඩා වැඩි කාර්ය ප්‍රමාණයක් පුරුෂයාට සාපේක්ෂව ඉටුකරනු අයුරු දක්නට ලැබේ. සිය ස්වාමියා විසින් රැස්කරනු ලබන ප්‍රමාණවත් නොවූ ආදායම හේතුකොටගෙන තම ගෘහීය කාර්යභාරය හා පරිබාහිරව අතිරේක ආදායම් රැස්කරවන්නියක් ලෙස බහුවිධ භූමිකාවක නිරත වීමට කාන්තාවට සිදුව තිබේ. ඒ අනුව අඩු ආදායම් තත්වයන් හේතුකොටගෙන කාන්තාවන්ගේ භූමිකාව කවරාකාර ස්වභාවයකින් ක්‍රියාත්මක වන්නේද, එම බහුවිධ භූමිකා හේතුකොටගෙන ඇය මුහුණදෙන ගැටළු කාරී තත්වයන් කවරේ ද යන්න හදුනාගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. ඒ අනුව මෙම අධ්‍යයනය මගින් අඩු ආදායම්ලාභී පවුල්වල රැකියාවන්හී නියුක්ත කාන්තාවන්ගේ බහුවිධ භූමිකා හේතුකොටගෙන ඔවුන් ගැටලුකාරී තත්ත්වයන්ට ස්වකීය ගෘහස්ථ කාර්යභාරය තුළ මුහුණපාන්නේ ද, යන්න පිළිබඳ විශ්ලේෂණය කරනු ලැබීය. අධ්‍යයනයට අදාල දත්ත රැස්කිරීමේදී අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස මාතර දිස්ත්‍රික්කයේ මැද්දවත්ත ප්‍රදේශය තෝරාගත් අතර එම ප්‍රදේශයේ අඩුආදායම්ලාභී පවුල් 15ක් සරල සසම්භාවී නියදීම් ක්‍රමය ඔස්සේ තෝරාගන්නා ලදි. ඒ අනුව ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලිය මගින් අධ්‍යයනයට අදාල ප්‍රාථමික දත්ත රැස්කරන ලදි. අධ්‍යයනයට අනුව ඇතැම් පවුල්වල පුරුෂයා ඉක්මවා කාන්තාව ආදායම් ඉපයීම් කළ අවස්ථා හඳුනාගත හැකිවිණි. එමෙන්ම ගෘහීය හා බාහිර ආර්ථික කටයුතු කෙරෙහි පුරුෂයාට වඩා වැඩි දායකත්වයක් කාන්තාව විසින් සිදුකරන අයුරු දක්නට ලැබුණි. ගෘහ කටයුතුවලදී පුරුෂයාගේ දායකත්වය දැක්විය හැකි අවස්ථාවන් තිබුණ ද ඒ කාර්යන් ස්ත්‍රී කාර්යභාරයක් ලෙස නොසලකා හැරීම් දක්නට ලැබුණි. නමුත් ගෘහීය කාර්ය කෙරෙහි පුරුෂයාගේ දායකත්වය ඉතා අවම මට්ටමක පැවතුණ ද තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ඇය බැහැර කරවීමක් හඳුනාගත හැකිවිණි. මේ අනුව කාන්තාවන්ගේ බහුවිධ භූමිකාව හේතුකොටගෙන නිවස තුළ නිදහස සීමාවීම, දරුවන්ගේ කටයුතු අඩාල වීම, පවුලේ ආර්ථිකය බිඳවැටීම මෙන්ම ස්වාමියා තුළින් හිරිහැරයට පත්වීම ආදී ගැටලුකාරී තත්ත්වයන්ට ඇය මුහුණ දීමට සිදුව තිබේ. මේ අනුව ආර්ථික මෙන්ම ගෘහීය කාර්යභාරය තුළ ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය සාධක, පුරුෂාධිපත්‍ය සංකල්පය තුළ කාන්තාව ගැටලුවලට ලක්වන බව නිගමනයකළ හැකි වේ.

*ප්‍රමුඛ පද: පුරුෂාධිපත්‍ය , කාන්තා භූමිකාව, ද්විත්ව භූමිකාව, සමාජ නවීකරණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය*